4.1 විශේෂාංග රූප සටහන

## ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික කම්පන: අවිනිශ්චිතබව නව සාමාන්‍යයයි


මෑත වසරවල දී, ශ්‍රී ලංකා ආර්ථිකය නිතරම මෙන්ම තීව්‍රව ඇතිවන දේශීය හා බාහිර කම්පනයන්ට මුහුණ දී ඇත. මෙම කම්පනවලින් යම් කොටසක් ස්වභාවික විපත් හේතුවෙන් ඇති වූවද, අනෙකුත් කම්පන දේශීය සහ ගෝලීය මනුෂ්‍ය ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති වී ඇත. මෙසේ නිතර නිතර ඇතිවන දැඩි ආර්ථික කම්පන හේතුවෙන් මතු වන ඉහළ අවිනිශ්චිතතාව, ගෘහ ඒකකවල පරිභෝජන සහ ඉතිරි කිරීමේ තීරණවලට මෙන්ම ව්‍යාපාරවල නිෂ්පාදන සහ ආයෝජන තීරණවලට ද බාධා එල්ල කරමින් රටේ වර්ධන විභවය අඩාල කරයි. තවද, ආර්ථික අර්බුදවල දී ආර්ථික ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ මාර්ග දුර්වල වීම සහ ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රතිඵල පුරෝකථන කිරීමට අපහසු වීම නිසා ඉහළ යන අවිනිශ්චිතතා හේතුවෙන් සාර්ව ආර්ථික මට්ටමේ තීරණ ගැනීම සහ ප්‍රතිපත්ති සම්පාදනය තවදුරටත් අභියෝගාත්මක වී ඇත.

මෙම කම්පනවල සමාජ-ආර්ථික බලපෑම් බහුවිධ වන අතර, එමගින් ආර්ථිකය මත දිගුකාලීන බලපෑම් ඇති කළ හැකිය. සාමාන්‍යයෙන්, මෙවැනි ආර්ථික කම්පන මගින් ජනගහනයේ අවදානමට ලක්විය හැකි කොටස් වෙත අසමානුපාතිකව වැඩි පීඩනයක් ඇති කරනු ලබන අතර, එමගින් ආර්ථික විෂමතාවන් තවදුරටත් උග්‍ර කරයි.

මෙසේ අවිනිශ්චිතබව 'නව සාමාන්‍යය' බවට පත්ව ඇති බැවින්, ශීඝ්‍රයෙන් දියුණු වන තාක්ෂණය, වර්ධනය වන ගෝලීය ගැටුම්, භූ-දේශපාලනික බෙදීම්, දේශගුණික විපර්යාස නිසා ඇති වන ස්වභාවික විපත්, පුනර්ජනනීය බලශක්තිය වෙත සංක්‍රමණය වීම, ඉහළ යන ආරක්ෂණවාදය සහ අනෙකුත් විවිධ කම්පන හේතුවෙන් අනාගතය තවදුරටත් අභියෝගාත්මක වනු ඇත.

පැවති වසංගත සහ ආර්ථික අර්බුද කාලයේ ලද අත්දැකීම් මගින් පෙනෙන ආකාරයට, විශේෂයෙන් ම ආර්ථිකය තුළ ප්‍රමාණවත් විදේශීය සහ රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක නොමැති විට සහ මූල්‍ය ප්‍රතිපත්ති අවකාශය සීමිත වන විට, මෙවැනි කම්පන නිසා ආර්ථික වර්ධනය අඩාල වීම සහ ඉහළ මෙන්ම අස්ථාවර උද්ධමනකාරී තත්ත්ව ඇති වීම ආදී වූ ගැටලු මගින් සැලකිය යුතු සාර්ව ආර්ථික අස්ථාවරත්වයක් කරා මග පෑදිය හැකිය. එබැවින්, ආර්ථික කැළඹීම් සහිත කාලවකවානුවල දී, ආර්ථිකය නිසි ලෙස හසුරුවා ගැනීම සඳහා ප්‍රමාණවත් සහ කාර්යක්ෂම රාජ්‍ය මූල්‍ය හා විදේශ ස්වාරක්ෂක ගොඩනැගීම අතිශයින් වැදගත් වේ. ප්‍රමාණවත් සංචිත පවත්වා ගැනීමේ වැදගත්කම දිට්වා සුළි කුණාටුව පැවති සමයේ මෙන්ම ඊට පසු කාලයේ දී මැනවින් පැහැදිලි විය. මීට අමතරව, ආපදා සඳහා පෙර සූදානම ශක්තිමත් කිරීම සහ රක්ෂණය වැනි අවදානම් බෙදාගැනීමේ

### ශ්‍රී ලංකා ආර්ථිකය මෑත වසරවල දී මුහුණ දුන් ප්‍රධාන අභ්‍යන්තර හා බාහිර කම්පන




**බාහිර කම්පන**

- **2011-12** - ගෝලීය තෙල් මිල ඉහළ යෑම - යුරෝ කලාපයේ තීව්‍ර වූ ස්වෛරීත්ව ණය අර්බුදය සහ තෙල් නිෂ්පාදනය කරන ඇතැම් මැද පෙරදිග සහ උතුරු අප්‍රිකානු රටවල භූ දේශපාලනික අවිනිශ්චිතතා
- **2020-21** - කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දිගුකාලයක් පුරාවට ගුවන්තොටුපළ, වරායන් මගී ගමනාගමනය සඳහා වසා දැමීම සහ සංචරණ සීමා පැනවීම ඇතුළු සමාජ ආර්ථික කටයුතු සීමා කිරීම මගින් ආර්ථිකයේ ප්‍රධාන අංශවලට බලපෑම් ඇති වීම
- **2025** - එක්සත් ජනපද තීරුබදු ප්‍රතිපත්ති සංශෝධන හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතාවයන්
- **2026 කාර්.1** - එක්සත් ජනපද-ඊශ්‍රායල-ඉරාන යුද්ධය සහ භූ දේශපාලනික අර්බුද මගින් ගෝලීය වෙළඳාම සහ සැපයුම් දාම කෙරෙහි බාධා කරමින් ඇති වූ දැඩි අවිනිශ්චිතතාවය

**අභ්‍යන්තර කම්පන**

- **2016** - ගංවතුර සහ නායයෑම්
- **2017** - 2016 වසරේ සිට අඛණ්ඩව පැවති නියං තත්ත්වයන්
- **2018** - දේශපාලන අස්ථාවරභාවය
- **2019** - පාස්කු ඉරිදා ප්‍රහාරය - සංචාරක කර්මාන්තයට දැඩි බලපෑම් ඇතිවීම
- **2022-23** - ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතිවූ මහජන පීඩනය හා දේශපාලන කැළඹීම
- **2025** - දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ කාලගුණික බාධා

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

යාන්ත්‍රණයන් ප්‍රවර්ධනය කිරීම මගින්, දේශගුණික අවදානම්වල බලපෑම් අවම කර ගැනීමට ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ට සහාය විය හැකිය. එසේම, ආර්ථික කම්පන හමුවේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් මත ඇති වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා මැනවින් ඉලක්කගත කළ, එහෙත් ප්‍රමාණවත් තරම් නම්‍යශීලී සමාජ ආරක්ෂණ ජාලයන් පැවතීම ද වැදගත් වේ.